රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : **21/2006(iv)**

මගේ අංකය :-ආ/4/3/1/14-1
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ - 07
2008.07.30

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික, අනියම්, ආදේශක කොන්ත්‍රාත් සහ සහන පදනම මත <u>බඳවාගත් සේවකයන් ස්ථිර කිරීම</u>

ඉහත මැයෙන් 2006.12.06 දාතමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2006 සහ ඊට සංශෝධිත වශයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ කෙරෙහි අවධානය යොමු කරවමි.

02. 2008.06.30 දින වන විට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හා සහන පදනම මත සේවයේ නියුතු, පහත සඳහන් සේවකයින් 2008.07.01 දින සිට ස්ථිර කිරීමට රජය තීරණය කර ඇත.

(1) 2008.04.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2006(III) න් සංශෝධිත 2006.12.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2006 සඳහන් සුදුසුකම් සපුරන, 2008.06.30 දිනට දින 180 ක් සේවය කර ඇති සේවකයින්,

(2) අදාල තනතුරේ බඳවා ගැනීමේ පරිපාටියේ නියමිත අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති වුවද, 2007.07.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2006 (1) හි සඳහන් පරිදි දින 3 කට නොඅඩු පුහුණුව සහ 2008.06.30 දිනට අවුරුදු 3 කට නොඅඩු අඛණ්ඩ සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කර ඇති සේවකයින්.

03) මීට පෙර නිකුත් කරන ලද චක්‍රලේඛ වල සඳහන් පුහුණුව සඳහා පිළිගත හැකි ආයතන අතරට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියද මෙයින් ඇතුලත් කරනු ලැබේ.

04) 2008.07.01 දින වනවිට අදල පුහුණුව ලබා නොමැති සේවකයින්ට එම පුහුණුව 2008.09.30 දිනට පෙර ලබාදී, පුහුණුව සම්පූර්ණ කරනු ලබන දින සිට ස්ථිර පත්වීම් ලබාදිය යුතුය.

05) 2008 වර්ෂය තුල මේ සඳහා වැටුප් ගෙවීම පිණිස මහා භාණ්ඩාගාරය මගින් අතිරේක ප්‍රතිපාදන ලබාදෙනු නොලැබේ.

06) එම චක්‍රලේඛ වල සඳහන් අනිකුත් අවශ්‍යතාවයන් තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක වනු ඇත.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය